**කන්තලේ ප්‍රාදේශීය සභාව**
**-----------------------------**
**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**
**----------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 04 දින ද ඉකත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 19 දින ද විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂයට අදාල විගණකාධිපතවරයාගේ වාර්තාව 2014 පෙබරවාරි 23 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

## 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට කන්තලේ ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිනුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම.

2014 ජනවාරි 27 දිනැති අංක පීඑල්/05/බීඒ/ශ්‍රිලරාඅගිප්‍ර දරන පළාත් පාලන සහ පලාත් සභා අමාත්‍යාංශයේ චක්‍රලේඛයට අනුව ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරණු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට කඩකුලී **ණයගැතියන්** 27 දෙනෙකුගෙන් ලැබිය යුතු රු. 1,930,805 ක කඩ කාමර කුලී වලින් 2008වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා වැඩිපුර ගෙවූ රු. 74,410 ක කුලී **පෙර ගෙවුම්** යටතේ ගිණුම්ගත නොකර ලැබිය යුතු කුලී වලින් හිලව් කර තිබීම නිසා ලැබිය යුතු කඩ කාමර කුලී රු. 74,410 ක් **ගිණුම් වල අඩුවෙන් දක්වා තිබුණි.**

(ආ) සේවක ණය ලේඛනය අනුව 2013 දෙසැම්බර් 31 දිනට රු. 4,450,814 ක් වූ සේවක ණය ශේෂය රු. 4,215,326 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් සේවක ණය රු. 235,488 ක අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) 2011 වර්ෂයේ දී ඉදිකරන ලද ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ රු. 11,881,502 ක් පිරිවැය ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) ආදාහනාගාරය ඉදිකිරීම වෙනුවෙන් සම්පූර්ණ කරන ලද වැඩ සඳහා 2013 දෙසැම්බර් 31 දක්වා වියදම් කරනු ලැබූ රු. 3,694,087 ක වටිනාකම කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදිකර 2013 වර්ෂයේ සභාවට භාරදුන් කඩකාමර 66 කින් යුත් පොළ වෙළඳපලේ ගොඩනැගිල්ලෙහි සහ කඩකාමර 24 කින් යුත් බස් නැවතුම්පලේ ගොඩනැගිල්ලෙහි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) මග නැගුම ග්‍රාමීය වැඩසටහන යටතේ ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රතිපාදන මගින් සමාලෝචිත වර්ෂයේ කොන්ක්‍රීට් කුට්ටි ගල් අතුරා නිම කරන ලද මාර්ග 14 කට අදාලව ගෙවිය යුතු වටිනාකම වූ රු. 6,994,018 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(උ) රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට වැඩ ආරම්භ කිරීම සඳහා ගෙවූ අත්තිකාරම් වලින් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු. 2,664,669 ක මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

පහත සඳහන් ගිණුම් විෂයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොමැතිකම නිසා එම විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පරීක්ෂා කිරීමට නොහැකි විය.

| ගිණුම් විෂයය | වටිනාකම (රු) | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 24,331,745 | විස්තරාත්මක උපලේඛන, ස්ථාවර වත්කම් ලේඛනය, හිමිකම් ඔප්පු |
| ලැබිය යුතු ගිණුම් | 16,158,350 | ශේෂ සනාථ ලිපි ,කාලවිශ්ලේෂණ, විස්තරාත්මක උපලේඛන |
| ගෙවිය යුතු ගිණුම් | 1,114,116 | |

### 1.3.4 නීති,රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති,රීති , රෙගුලාසි සහ විධි විධානවලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1989 අප්‍රේල් 17 දින අංක 554/ 5 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 59 වැනි රීතිය. | සභා බල ප්‍රදේශයට අයත් ව්‍යාපාර ආයතන පිළිබඳ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |
| (ආ) පලාත් පාලන, පලාත් සභා හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය | මාස 06 කට වරක් වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කල යුතු වුවද, සභාව සතු වාහන 16 සම්බන්ධයෙන් එසේ කර නොතිබුණි. |
| (ඇ) පළාත් පාලන කොමසාරිස්ගේ අංක 1980/22 දරන චක්‍රලේඛයේ 3 ජේදය | හිඟ ආදායම් පිළිබඳ කාල විශ්ලේෂණයක් පිළියෙල කර නොතිබුණි. |
| (ඇ) පළාත් මූල්‍ය රීති අංක 236 | නිකුත් කර මාස 06 ඉක්මවා තිබූ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ රු. 30,305 ක් වටිනා චෙක්පත් 03 ක් සම්බන්ධයෙන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශ අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 4,846,449 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 1,533,325 ක් විය. පසුගිය වර්ෂයට සාපේක්ෂව ආදායම් ආධාර රු. 2,426,110 කින් අඩුවීම සහ ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තු වියදම් රු. 3,258,526 කින් වැඩි වීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 6,379,774 කින් පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු තිබුණි.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 5,320 | 4,666 | 9,610 |
| බදු කුලී | 7,125 | 3,314 | 5,667 |
| බලපත්‍ර ගාස්තු | 555 | 731 | - |
| වෙනත් ආදායම් | 9,554 | 17,282 | 2,000 |

### 2.2.2 මුද්දර ගාස්තු

නැගෙනහර පලාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2013 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු වශයෙන් ලැබිය යුතු මුදල් හඳුනාගැනීමට සහ ලබා ගැනීමට විගණිත දිනය වූ 2014 ඔක්තෝබර් 02 දින වන විටද කටයුතු කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) **ඉදිකර තිබූ පොදු වෙළඳපල හා බස්නැවතුම්පල කඩ කාමර වෙළඳුන්ට ලබා නොදීම.**

2011 වර්ෂයේ දී පැරණි කඩ කාමර 32 ක් කඩා ඉවත් කර නව පොදු වෙළඳපොලේ කඩ කාමර 66 ක් සහ බස්නැවතුම්පලේ කඩ කාමර 24 ක් නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදිකිරීම් සම්පූර්ණ කර 2013 මාර්තු 27 දින ප්‍රාදේශීය සභාවට භාරදී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. නාගරික සංවර්ධන අධිකාරියෙන් පවරා ගන්නා ලද ඉහත සඳහන් කඩ කාමර 90 සභාවට පවරාගත් දින සිට මාස 18 කට වැඩි කාලයක නිෂ්කාර්යව පැවතුණි.

ii. නව වෙළඳ සංකීර්ණය ඉදිකිරීමේ දී කඩා ඉවත්කරන ලද කඩ කාමර හිමියන් 32 කට සහ ප්‍රාදේශීය වෙළඳුන්ට ප්‍රමුඛතාවය ලැබෙන ලෙස කඩ කාමර බෙදා දීම සඳහා සුදුසු වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට විගණිත දිනය වූ 2014 ඔක්තෝබර් 02 දින වන විටද සභාව අපොහොසත් වී තිබුණි.

**(ආ) භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම.**

---

මේ සම්න්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

i. 2014 ජූලි 02 දින පැවැත් වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව අළුත්වැඩියා කිරීමට නිර්දේශ කර තිබූ භාණ්ඩ වර්ග 23 ක් අළුත්වැඩියා කිරීමටත් , ඉවත්කිරීමට නිර්දේශ කර තිබූ භාණ්ඩ වර්ග 138 ක් සහ පොත් 363 ක් ඉවත් කිරීමටත් අවශ්‍යය කටයුතු කර නොතිබුණි.

ii. භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ප්‍රාදේශීය සභාවට අයත් ස්ථාන 11 කට අදාලව පවතින සියළුම භාණ්ඩ අයිතම නව පරිගණක ලේඛනයට අනුව ආකාරාදි පිළිවෙලට නැවත අංක කර ඒ අනුව බඩු වට්ටෝරු පොත් අළුතින් සකස් කිරීමේ ක්‍රියාවලියේ ප්‍රගතිය විගණිත දිනය වු 2014 ඔක්තෝම්බර් 02 දින වන විට ද සතුටුදායක තත්වයක නොතිබුණි.

(ඇ) වටිනාකම රු. 42,949 ක් වූ පොත් 235 ක් අස්ථානගත වී තිබුණු අතර, ඒ සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) මිල ගණන් කැඳවීමේ , මිල ගණන් විවෘත කිරීමේ සහ තාක්ෂණික ඇගයීම් කමිටුවක් මගින් සුදුසු සැපයුම්කරුවන් තෝරා ගැනීමේ විධිමත් පරිපාටියක් අනුගමනය නොකර සමාලෝචිත වර්ෂයේ දී එකතු වටිනාකම රු. 933,687 ක භාණ්ඩ මිලදී ගෙන තිබුණි.

(ඉ) වෙළඳ බලපත්‍ර ගාස්තු සඳහා ඇස්තමේන්තු සකස් කිරීමට අවශ්‍යය ක්‍රියාමාර්ග නොගෙන වර්ෂය තුල ලද ගාස්තු සියල්ලම වර්ෂයේ ආදායම් ලෙස **සලකා** තිබීමෙන් සමාලෝචිත වර්ෂයට අදාල ආදායම නිවැරදිව හඳුනා ගෙන නොතිබුණි.

3.2 ඌණ උපයෝජිත වත්කම්
----------------------------

1997 වර්ෂයේ දි මිලදීගත් වෑන් රථය 2013 නොවැම්බර් මාසයේ දී ක්‍රියාවිරහිතව වාහන අංගනයේ ගාල්කර තිබුණත් ඒ සම්බන්ධයෙන් සුදුස ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

3.3 හඳුනාගත් අලාභ
-----------------------

2005 සැප්තැම්බර් 08 දින ආරම්භ කර තිබූ රු.මිලියන 04 ක වටිනා ස්ථාවර තැන්පතු සභාවේ හිටපු ලේකම්වරයා විසින් සංවර්ධන වැඩ සඳහා යොදවා ගැනීමට 2010 ජනවාරි 05 වන දින මුදල් කරවා ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉහත සඳහන් රු. මිලියන 04 න් රු. මිලියන 01 ක සභාවේ ජංගම ගිණුමකට බැර කර තිබුණු අතර, ඉතිරි රු. මිලියන 03 ඔහු විසින් සභාව වෙත විගණිත දිනය වූ 2014 ඔක්තෝබර් 02 දින වන විටද ලබා දී නොතිබුණි. 2014 දෙසැම්බර් 11 දිනැති සභා ලේකම්ගේ වාර්තාව අනුව මේ සම්බන්ධයෙන් උසාවියේ නඩුවක් විභාග වෙමින් පවතී.

(ආ) අවුරුදු 04 කට වැඩි කාලපරිච්ඡේදයක් තුල සභාව සතු ඉහත සඳහන් මුදල සභාව වෙත ලබා නොදී ඇතත් සභාව විසින් මේ සම්බන්ධයෙන් ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II වන කොටසෙහි XLVIII පරිච්ඡේදය ප්‍රකාරව විනය පරීක්ෂණයක් පවත්වා නොතිබුණි.

3.4 කොන්ත්‍රාත් පරිපාලනය
--------------------------

ප්‍රාදේශීය සභාව 2012 නොවැම්බර් 08 දින රු. 15,848,605 ක කොන්ත්‍රාත් වටිනාකමකට කන්තලේ නගරයේ විදුලි ආදාහනාගාරයක් ඉදිකිරීම සඳහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සමඟ ගිවිසුම් අත්සන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) කොන්ත්‍රාත් ගිවිසුමට අනුව 2013 මාර්තු 08 දින ඉදිකිරීම් අවසන් කල යුතුව තිබුණ ද , විගණිත දිනය වූ 2014 ඔක්තෝබර් 02 දින වන විටද ඉදිකිරීම් වැඩ සම්පූර්ණ කර නොතිබුණත් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර ගැනීමට අවශ්‍යය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) 2005 අංක 03 දරන මුදල් පනතේ III කොටසේ ප්‍රකාර (2007 අංක 13 හා 2009 අංක 18 දරන මුදල් සංශෝධන පනත්වලින් කරනු ලබන සංශෝධනවලට යටත්ව) කොන්ත්‍රාත්කරුට ගෙවා තිබූ රු. 5,194,037 ට අදාල කර්මාන්ත සහතික අරමුදල් බද්ද (CIGFL) වන රු. 12,985 ක් රඳවාගෙන දේශීය ආදායම් කොමසාරිස්ට යැවීමට කටයුතු කර නොතිබුණි.

## 3.5 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

ප්‍රාදේශීය සභාව ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් 2011 ජූලි 25 දින ප්‍රජා මණ්ඩල සමිතියක් සමඟ රු. 324,530 ක කොන්ත්‍රාත් වටිනාකමකට ගිවිසුම් අත්සන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත් ගිවිසුමට අනුව 2012 ජනවාරි 25 දින වන විට ඉදිකිරීම් අවසන් කල යුතු වුවද විගණිත දිනය වූ 2014 ඔක්තෝබර් 02 දින වන විටද ඉදිකිරීම් අවසන් කර නොතිබුණි.

(ආ) සමිතිය මගින් රු. 388,368 ක කල වැඩ වටිනාකමකට 2011 ඔක්තෝබර් 31 දින ඉදිරිපත් කර තිබූ බිල්පත සඳහා විගණන දින වන විටද කළවැඩ වටිනාකම සහතික කර ගෙවීම් කිරීම සඳහා අවශ්‍යය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 වගන්තියට අනුව පවරන ලද වැඩ උප කොන්ත්‍රාත් නොදිය යුතු වුවද, උප කොන්ත්‍රාත්කරුට ගෙවීම් ප්‍රමාද වීම සම්බන්ධයෙන් ඔහු විසින් ඉදිරිපත් කරන ලද ලිපි අනුව මෙම ඉදිකිරීම් සමිතිය විසින් උප කොන්ත්‍රාත්කරුවෙකු වෙත පවරා තිබුණි.

(ඇ) මෙම ගොඩනැගිල්ල කොන්ක්‍රීට් කණු 06 ක් තනා බිමට කොන්ක්‍රීට් අතුරා යකඩ (Angle Iron) බට වලින් වහලය තනා ඉදිකර තිබූ අතර එහි වහලය සෙවිලි කර නොතිබූ බැවින් වහලයේ යකඩ බට මළ කෑමට ලක් වී තිබුණි.

## 3.6 මානව සම්පත් කළමනාකරණය

### අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2013 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| විධායක මට්ටම | 03 | 01 | 02 |
| ද්විතික මට්ටම | 19 | 16 | 03 |
| තෘතීය මට්ටම | 28 | 24 | 04 |
| **එකතුව** | **50** | **41** | **09** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) 2014 අප්‍රේල් මස සිට පුරප්පාඩුව පවතින ප්‍රාදේශීය සභාවේ ලේකම් තනතුර සඳහා සුදුසු පුද්ගලයකු පත් කිරීමට විගණිත දින වන විටද කටයුතු කර නොතිබුණ අතර, වැඩබැලීමේ පදනම මත ලේකම්වරයෙකු පත්කර තිබුණි.

(ආ) ආයුර්වේද වෛද්‍ය නිලධාරි , සංවර්ධන නිලධාරි , ආදායම් පරීක්ෂක , රියදුරු , යන්ත්‍ර ක්‍රියාකරු , සෞඛ්‍ය කම්කරු සහ වැඩ පරීක්ෂක තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට විගණිත දිනය වන විටද කටයුතු කර නොතිබුණි.

## 04. පද්ධති හා පාලන

-----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) ස්ථාවර වත්කම් පාලනය

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඉ) මානව සම්පත් කළමනාකරණය